# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 6
- විෂයය - ඉතිහාසය
- පාඩම - 05 - අපේ අභීත රජවරු


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# වසභ රජතුමා



## ➢ වසභ රජතුමා කවුරුන්ද ?

❖ වසභ රජතුමාගේ දෙමාපියන් පිළිබඳව ඉතිහාස පොත්වල සඳහන් නොවේ

❖ ළමා කාලයේ එතුමා කාලය ගත කර ඇත්තේ තම මාමාගේ නිවසේය

❖ වසභ රජතුමා **ලම්බකර්ණ** නම් රජ පෙළපතේ ආරම්භක පාලකයාය

❖ ලම්බකර්ණවරුන් අතීතයේ රටේ ලේඛන කටයුතු භාරව සිටි පිරිසකි



## ▪ වසභ රජුගේ වාරිකාර්මික සේවාව

- විශාල වැව් තැනීම ආරම්භ කරන ලද්දේ වසභ රජතුමාය
- එතුමා විශාල ප්‍රමාණයේ වැව් 11 ක් ඉදි කරවා තිබේ



## ❖ වසභ රජතුමා ඉදි කරවූ වැව්

| අතීත නම | වර්තමාන නම |
|---|---|
| මයෙන්ති වැව | මහවිලච්චිය වැව |
| මානාකැටි වැව | මානන්කට්ටිය වැව |
| වාතමංගන වැව | නොච්චිපොතාන වැව |

මෙම වැව් සියල්ලම පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය



- වසභ රජතුමා වැව්වලින් කුඹුරුවලට ජලය ගෙනයාමට ඇළ මාර්ග 12ක් ද තැනවීය

- සැතපුම් තිහක් දුරට ජලය ගෙන යන **ඇළහැර ඇළ** වසභ රජුගේ නිර්මාණයකි

- නාන පොකුණුවලට ජලය ගෙන යාම සඳහා මෙකල උමං ජල මාර්ග තනා තිබේ

- ඒවා **උමං ජල මාතිකා** නමින් හැඳින්වේ






- විවිධ මල් සුවඳ අතරින් දෑ සමන් මල් සුවඳ අග්‍ර වේ යැයි වසභ රජුට දැනගන්නට ලැබුණි
- එය සත්‍ය දැයි පරික්ෂා කිරීමට රජුට සිත් විය
- රජතුමා නොයෙක් මල් වර්ගවලින් මිට මිට බැගින් කාමරයක තබා දෑ සමන් මල් මිටක් ද තබා දොර වසා පිටතට පැමිණ ඇත
- ටික වේලාවකින් කාමරයේ දොර හැර ඇතුළුවන විට සියලු මල් සුවඳට පෙර දෑසමන් සුවඳ එතුමාට දැනී තිබේ
- මෙම පරීක්ෂණයෙන් පසු දෑසමන් සුවඳ අග්‍ර වන බව රජතුමා පිළිගත්තේය

❖ **යමක් පිළිබඳව විමසිලිමත්ව සිතා බලා තීරණ ගැනීම වසභ රජ තුළ පැවති උසස් ගුණයක් බව මේ කතාවෙන් පැහැදිලි වේ**

## ❖ පාලන කටයුතු

- රටේ පාලන කටයුතු පහසු කිරීමට රජතුමා ලංකාව ප්‍රදේශවලට බෙදා තිබේ
- ඒවායේ පාලන කටයුතු මෙහෙයවීමට රජයේ නිලධාරීන් පත් කර තිබුණි
- යාපනය ප්‍රදේශය පාලනය කිරීමට රජතුමා පත්කර යැව්වේ **ඉසිගිරිය** නම් ඇමතිවරයෙකි
- ඒ බව රජතුමා විසින් රන්පත් ඉරුවක ලියා තිබේ
- එය **වල්ලිපුරම් රන්පත් ඉරුව** නමින් හැඳින්වේ
- ඉසිගිරිය ඇමතියා යාපනයේ **පියංගුකතිස්ස** නමින් විහාරයක් කරවූ බව ද වල්ලිපුරම් රන්පත් ඉරුවේ ලියා තිබේ



- අනුරාධපුර නගරයේ ආරක්ෂාවත් අලංකාරයත් වැඩිදියුණු කිරීමට රජතුමා කටයුතු කළේය





- නගරය වටා ප්‍රාකාරයක් ඉදි කරවීමට එතුමා කටයුතු කළේය
- නගරයේ තැනින් තැන පොකුණු ඉදිකර ඒවාට වැව්වලින් ජලය ගලා යාමට සැලැස්වීය
- ඉන්පසු ඒවායේ හංසයින් ඇති කරන ලෙසට උපදෙස් දුන්නේය

## ➢ ආගමික කටයුතු


- වසභ රජතුමා ථූපාරාම දාගැබට වටදාගෙයක් ඉදි කළේය
- ඉසුරුමුණි විහාරයේ පොහොය ගෙයක් ඉදිකරවා භික්ෂූන් වහන්සේලාට පූජා කළේය
- සිතුල්පව්ව විහාරයේ දාගැබ් ඉදිකරවීය
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කළේය



- වසභ රජතුමා බදු අය කිරීම ක්‍රමවත් කළේය
- රජයට අයත් වැව්වලින් ජලය ලබා ගන්නා අයගෙන් රජතුමා බදු අය කළේය
- එම මුදල් නැවත යෙදවූයේ එම වැව් ප්‍රතිසංස්කරණය කිරීමටය

➢ **වසභ රජුගේ රාජ්‍ය කාලය වසර 44 කි**





## ❖ වසභ රජුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- ✓ ධෛර්යවන්ත බව
- ✓ දුර දක්නා නුවණ
- ✓ විමසිලිමත්ව කටයුතු කිරීම



## ▪ ක්‍රියාකාරකම

1. වසභ රජු අයත් වූ රජ පෙළපත නම් කරන්න
2. වසභ රජු ඉදිකළ විශාල ප්‍රමාණයේ වැව් සංඛ්‍යාව කොපමණද ?
3. එතුමා ඉදිකළ වැව් තුනක අතීත නම් ලියා ඒ ඉදිරියෙන් වර්තමාන නම් ලියා දක්වන්න
4. වසභ රජු ඉදිකළ ඇළ මාර්ග සංඛ්‍යාව කොපමණද ?
5. එතුමා ඉදිකළ ප්‍රධාන ඇළ මාර්ගයක් නම් කරන්න
6. මෙකල නාන පොකුණුවලට ජලය ගෙන යාම සඳහා හඳුන්වා දුන් ක්‍රමය කුමක්ද ?
7. රටේ පාලනය පහසු කරවීම සඳහා රජු ගත් ක්‍රියාමාර්ගයක් ලියා දක්වන්න
8. යාපනය ප්‍රදේශය පාලනය කිරීම සඳහා රජු විසින් පත් කර යවන ලද ඇමතිවරයා නම් කරන්න
9. ඒ බව සඳහන් වන රන්පත් ඉරුව නම් කරන්න
10. එම ඇමතිවරයා යාපනයේ ඉදිකළ විහාරය නම් කරන්න
11. අනුරාධපුර නගරයේ ආරක්ෂාව හා අලංකාරය වැඩි දියුණු කිරීමට රජු ගත් ක්‍රියාමාර්ග මොනවාද ?
12. රජුගේ ආගමික සේවාවන් හතරක් ලියා දක්වන්න
13. රජයට අයත් වැව්වලින් ජලය ලබා ගන්නා අයගෙන් අය කළ බදු මුදල් රජතුමා යෙදවූයේ කුමක් සඳහාද ?
14. වසභ රජුගේ රාජ්‍ය කාලය කොපමණද ?
15. වසභ රජුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ මොනවාද ?

ස්තූතියි!

තමාලි පෙරේරා